# නන්නත්තාර සංස්කෘතිය

ඊනියා ද්විභාෂික උගත්තු විශ්වවිද්‍යාලයීය සම්ප්‍රදායෙන් බිහිවූහ. ඔවුහු බටහිර නවකතා, කෙටි කතා පමණක් නොව බටහිර විද්‍යාව ඇතුළුව සමස්තයක් ලෙස ගත්කල බටහිර දැනුම අගය කළහ. එහෙත් ඔවුහු සංගීතයෙහි දී උත්තර භාරතීය සංගීතයට ආකර්ෂණය වූහ. එසේ වුවත් බටහිර විද්‍යාව අහය කළවුන් ලෙස හා බටහිර විද්‍යාඥයන්ගේ හා දාර්ශනිකයන්ගේ මතවාද පිළිගත්තවුන් ලෙස ආයුර්වේදය නොව බටහිර වෛද්‍යවිද්‍යාව අගය කළහ. ඇතැම්හු බටහිර වෛද්‍යවිද්‍යාව එකම වෛද්‍යවිද්‍යාව ලෙස හා සත්‍ය වෛද්‍යවිද්‍යාව ලෙස පිළිගත්හ. එවැන්නන්ට ආයුර්වේදය මිථ්‍යාවක් විය.

දේශපාලන වශයෙන් ගත්කල ඔවුහු දෙපිළකට බෙදුනහ. ඔවුහු සියළු දෙනාම පාහේ බටහිර දියුණුව එකම දියුණුව ලෙස පිළිගත්හ. අප දියුණුවිය යුත්තේ බටහිර ක්‍රමයට අනුව යැයි ඔවුහු කිසිම වගවිභාගයක් නැතිව උපකල්පනය කළහ. එහෙත් ඔවුන් සියළු දෙනාම බටහිර ධනපති ක්‍රමය පිළිගත්තේ යැයි මෙයින් අදහස් නො කෙරෙයි. ඇතැම් ඊනියා ද්විභාෂිකයෝ බටහිර අච්චුවේ ම විකල්පය වූ මාක්ස්වාදී සමාජවාදය පිළිගත්හ. මේ පිරිස ධනපති ආර්ථික ක්‍රමයට පමණක් නොව ධනේශ්වර දේශපාලනයට ද විරුද්ධ වූහ. ඊනියා කම්කරු පංති නායකත්වයෙන් විප්ලවය කිරීම ඔවුන්ගේ බලාපොරොත්තුව විය.

ඇතැම් ඊනියා ද්විභාෂික උගත්තු බටහිරට වඩා ඉන්දියාවට ඇල්මක් දැක්වූහ. එසේ ඇළුම්කළ අය මූලික වශයෙන් අධිරාජ්‍ය විරෝධී වූවෝ ය. අධිරාජ්‍ය විරෝධී නොවී ද ඉන්දියාවට ඇළුම්කළ අය සිටි බවත් එමෙන් ම ඇතැම් අධිරාජ්‍ය විරෝධීන් ඉන්දියාවට ඇළුම් නොකළ බවත් මෙහි දී මතක තබාගත යුතු ය. මේ සම්බන්ධයෙන් සරල සූත්‍රයක් ගොඩ නගාගත නොහැකි වන අතර ඒ ඒ අයගේ ලෝක දෘෂ්ටි අනුව ඔවුහු විවිධ මත දැරූහ. ඉන්දියාව මූලික වශයෙන් බෞද්ධ විරෝධීය යන්න මේ කිසිවකුගේවත් අවධානයට ලක් වී යැයි නො සිතමි. ඉන්දියාවට ඇල්මක් දැක්වූ බොහෝ අය සිතා සිටියේ ඉන්දියාවෙන් අපට අවැඩක් නොවනු ඇත කියා ය.

මේ සියළු පරස්පර මැද සිංහල විදග්ධ සංස්කෘතියක් ගොඩනැගීමට වෑයම්කළවුන් බටහිර දැනුම එකම සත්‍ය දැනුම ලෙස පිළිගත් අතර සාහිත්‍යයෙහි හැරෙන්නට සංගීතයෙහි හා වෙනත් සෞන්දර්යයාත්මක විෂයන්හි ද ඉන්දියාව (පැරණි භාරතය) අනුකරණය කළහ. සාහිත්‍යයෙහි ද අනෙක් ක්ෂේත්‍රවල ද ඔවුහු සමස්තයක් ලෙස ගත්කල බටහිරයන් අනුකරණය කළහ. මොවුහු බටහිර විශ්වවිද්‍යාලයීය සම්ප්‍රදාය අනුව සිතූ ඊනියා ද්විභාෂික උගත්තු වූහ. එදිරිවීර සරච්චන්ද්‍ර, ඇම්. ජේ. පෙරේරා ආදී මහත්වරු මේ ව්‍යාපෘතියෙහි මුල්තැන් ගත්තෝ ය. අප කලින් ද සඳහන් කර ඇති පරිදි මාර්ටින් වික්‍රමසිංහ මහතා ඉන්දියාව සම්බන්ධයෙන් තරමක් වෙනස් අදහස් දැරී ය. භාරතීය සංස්කෘතියෙන් සිංහල සංස්කෘතිය අදීනවීම අවධාරණය කළ ඒ මහතා සිංහල සංස්කෘතියේ ඇතැම් අංග බටහිර සංස්කෘතිය සමග සමපාතවන්නේ යැයි වැරදියට විශ්වාස කෙළේ ය

සිංහල විදග්ධ සංස්කෘතියක් ගොඩනැගීමට මහාචාර්ය ජී. පී. මලලසේකර මහතා ද උත්සාහ දැරූ බව මෙහි දී සඳහන් කළ යුතු ය. ඒ මහතා ද මුල් කාලයේ දී ලංකා ගුවන්විදුලියට සම්බන්ධ ව විශාල කාර්යභාරයක් ඉටුකෙළේ ය. එයට අමතරව ඒ මහතා බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට ද සමස්තයක් ලෙස බුද්ධසසුන පෝෂණයකිරීමට ද කැපවීමෙන් වැඩ කෙළේ ය. ඒ අතර තවත් බොහෝ දෙනා ද සිංහල විදග්ධ සංස්කෘතියක් ගොඩනැගීමට විවිධාකාරයෙන් දායක වී ඇත. කලින් ද සඳහන්කර ඇති පරිදි කුමාරතුංග මුනිදාස මහතා අන් සියල්ලන්ට වඩා වෙනස් මඟක් ගත්තේ ය. ඒ මහතා ඉන්දියාවෙන් මුළුමනින් ම මෙන් ස්වාධීන වීමට උත්සාහ කෙළේ භාරතීය සංස්කෘතීන් හා සිංහල සංස්කෘතිය අතර වූ සම්බන්ධකම් නොසලකා හරිමිනි.

කෙසේ වෙතත් අවසානයේ දී සිංහල විදග්ධ සංස්කෘතියෙහි බොහෝ ලක්ෂණ සරච්චන්ද්‍ර ඇම් ජේ පෙරේරා මහතුන්ගේ දායකත්වයෙන් බිහිවිණි. සරච්චන්ද්‍ර මහතා විදග්ධ ගැමි සංස්කෘතිය දෙස බැලුවේ නාට්‍යකරණයෙහි දී පමණ ය. සිංහල ගැමි නාටකය යනුවෙන් කෘතියක් ද සම්පාදනය කළ ඒ මහතා මනමේ හා සිංහබාහු නිර්මාණය (නිෂ්පාදනය) කිරීමෙහි දී මෙරට නාට්‍ය සම්ප්‍රදාය අනුගමනය කෙළේ ය. අද ශෛලිගත නාට්‍ය සම්ප්‍රදාය යනුවෙන් හැඳින්වෙන මේ

© Prof. Nalin De Silva

නාට්‍ය සම්ප්‍රදාය ගැන විධිමත් පූර්ණ අධ්‍යයනයක් තවමත් කෙරී නැත. සරච්චන්ද්‍ර මහතාගේ අදහස වූයේ මේ නාට්‍ය සම්ප්‍රදාය නාඩගම් ඇසුරෙන් මෙරටට හඳුන්වා දී ඇති බව ය. ඒ හඳුන්වා දී ඇත්තේ දෙමළ කතෝලික පූජකවරුන් ඔස්සේ බව ඒ මහතාගේ අදහස විය. එහෙත් මහාචාර්ය දෑල බණ්ඩාර මහතා දරන්නේ වෙනත් අදහසකි. ඒ මහතාට අනුව පෘතුගීසීන් පැමිණීමට පෙර ද මේ නාට්‍ය සම්ප්‍රදාය මෙරට තිබී ඇත..අඩුම තරමින් දඹදෙණි යුගය දක්වා ඒ සම්ප්‍රදායෙහි සම්භවය ගෙනයෑමට ඒ මහතා සමත් වෙයි. කවි නළුව පමණක් නොව ගී නළුව ද සිංහල නාට්‍ය ක්ෂේත්‍රයෙහි ඈත අතීතයෙහි ද දැකිය හැකි බව ඒ මහතා පෙන්වා දී ඇත.

අපට සංගීතයක් ලැබුණේ පෘතුගීසීන්ගෙන් පසුව යැයි කියන්නන්ට සරච්චන්ද්‍ර මහතාගේ අදහස් ප්‍රියජනක බව අමුතුවෙන් කිවයුතු නො වේ. එහෙත් සිංහල සංස්කෘතියෙහි සංගීතයක් නොතිබිණි යැයි කීම පිළිගත හැක්කක් නො වේ. ලෝකයේ කිසිම රටක නොමැති බෙර වාදන සිංහලයන් නිර්මාණය කර ඇත. වාදනය ද අවසාන විග්‍රහයෙහි අයත්වන්නේ සංගීතයට ය. පිරිත් දේශනා ද අපට සිහිගන්වන්නේ සිංහල සංගීතයකි. ඇතැම් නෙළුම් කවි පිරිත් මෙන් ඇසෙන බව රහසක් නො වෙයි. ඒ පිරිත් දේශනා කිරීමේ ක්‍රම නිර්මාණය කළ භික්ෂූන් වහන්සේ සිංහල සංස්කෘතියේ සිංහල භික්ෂූන් වහන්සේ ය. උන්වහන්සේ සිංහල ගීත ගායනාවලින් ආභාසය නොලැබී යැයි කීමට නො හැකි ය. අනෙක් අතට අනුරාධපුරයෙහි ඇති චිත්‍ර හා කැටයම්වලින් වාදකයන් නිරූපණය වන්නේ එකල මෙරට සංගීතයක් තිබුණු බැවිනි. සිංහල සංගීතය ගැන අධ්‍යයනය කරන්නන් අනෙක් ථෙරවාද රටවල සංගීතය ද හදාරන්නේ නම් මැනවි යැයි සිතමි. අනෙක් ථෙරවාදී රටවල ඇත්තේ ඒ ඒ රටවල සංස්කෘතීන්ට අවශෝෂණය කෙරුණු සිංහල බෞද්ධ සංස්කෘතියක් බව පැහැදිලි ය. දෑල බණ්ඩාර මහතා සඳහන් කරන ගී නළුව ද අපට කියන්නේ අපේ පැරණි සිංහල සංගීතයක් තිබූ බව ය.

කෙසේ වෙතත් සිංහල විදග්ධ සංස්කෘතියක් නිර්මාණයකිරීමට තැත්කළ අය අසාර්ථක වී ඇති බව පැහැදිලි ය. ඔවුන් අවසන් වශයෙන් කර ඇත්තේ බටහිර කෙටි කතා හා නවකතා අච්චුවේ සිංහලෙන් ලියන ලද කෘති කියවන, උත්තර භාරතීය සංගීතය අගය කරන, බටහිර විද්‍යාව ඇතුළු අනෙක් බටහිර දැනුම් එකම සත්‍යය ලෙස සලකන බටහිර අච්චුවේ නාට්‍ය නරඹන ඇතැම් විට ව්‍යාජ බටහිර සංගීත අච්චුවක කේමදාස මහතා අනුගමනය කරමින් අනුකාරක සංගීතය රස විඳින ඉතා සුළු පිරිසක් බිහිකිරීම ය. ඒ අතර ගැමියන් හා ගමෙන් නගරයට පැමිණි නන්නත්තාරවූවන් අමතක කිරීම ය. ඒ නන්නත්තාරවූවන්ගේ සංස්කෘතිය ඊනියා ජනප්‍රිය සංස්කෘතිය ලෙස අද නම්කෙරී ඇත්තේ සරත් අමුණුගම නම් සමාජවිද්‍යාඥයාගේ අනුකරණය පසුපස ගොසිනි.

සිංහල සමාජයේ සංස්කෘතික වර්ගීකරණයෙහි හතරවැනි ස්ථරය මේ පිරිසගෙන් සමන්විත වෙයි. මෙය ජනප්‍රිය සංස්කෘතිය ලෙස නොව නන්නත්තාර සංස්කෘතිය ලෙස හැඳින්විය හැකි ය. මුල දී ලංකා ගුවන් විදුලි සේවයෙහි වෙළෙඳ සේවය වෙන්වූයේ මේ පිරිස සඳහා ය. අද වන විට හතු පිපෙන්නාක් මෙන් බිහි වී ඇති විවිධ ගුවන්විදුලි නාලිකා හා රූපවාහිනී නාලිකා මේ අය සඳහා වෙන් වී ඇත. මේ පිරිස අද සමාජයේ බහුතරය බවට පත්වී ඇත. සිංහල සමාජයෙහි ඉංගිරිසි සංස්කෘතිය අගයන ස්ථර දෙක මේ පිරිසෙන් වෙන් වී ඇති අතර ව්‍යාජ සිංහල විදග්ධ සංස්කෘතිය තම සංස්කෘතිය යැයි පිළිගන්නා අය හා මේ නන්නත්තාරවූවන් අතර ඇත්තේ ද විශාල පරතරයකි. නන්නත්තාරවූවෝ බටහිර අච්චුවේ නවකතා නො කියවති. ඔවුන්ට ඊනියා සම්භාව්‍ය නාට්‍ය හා චිත්‍රපටි බොරු මනස්හාත පමණක් වෙයි. එහෙත් මේ නන්නත්තාර බහුතරය අද ව්‍යාජ විදග්ධ අතළොස්සට අභියෝග කරනු දැකි ය හැකි ය. ජාතික යැයි කියන නාලිකාවලට පවා අද මේ නන්නත්තාරයන්ගේ නාලිකා අනුකරණය කිරීමට සිදු වී ඇත. අද විදග්ධ සංස්කෘතිය ගෙන එන්නේ යැයි කියන නාලිකාවලට ද නායකත්වය සපයන්නේ මේ නන්නත්තාරවූවන්ගේ සංස්කෘතිය ගෙන එන නාලිකා ය.

නන්නත්තාරවූවන්ගේ කුලකයට බොහෝ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයෝ ද ඇතුළත් වෙති. ගමෙන් පැමිණි මේ බොහෝ දෙනාට බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සංස්කෘතිය අවශෝෂණය කරගැනීමට නො හැකිවිය. සිංහලෙන් අධ්‍යාපනය ලැබීම ද එයට හේතුවක් වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව දැනුම වුව ද සිංහලයෙන් ලබාදීමේ දී යම් වෙනස්කම්වලට භාජනය වන බැවිනි. කෙසේ වෙතත් ප්‍රභූ පාසල්වල මෙන් ම මධ්‍යම මහා විද්‍යාලවල ද අධ්‍යාපනයෙන් දැන් පෙර මෙන් නොව බටහිර සංස්කෘතික ආභාසය ලබා නො දෙයි. මේ සිසුහු පාසල්වල දී හා විශ්වවිද්‍යාලවලදී සිංහල විදග්ධ සංස්කෘතියට ද ඇතුල් කරගනු නො ලැබුහ. ඔවුන්ට කළහැකිව තිබුණේ නන්නත්තාර සංස්කෘතිය

© Prof. Nalin De Silva

අවශෝෂණය කරගැනීම පමණ ය. ඔවුන්ට බටහිර නවකථා රසවිඳීමට නො හැකි විය. එමෙන් ම ඔවුන්ට ගැමි සංස්කෘතියට ද උරුමකම් කීමට නො හැකි විය.

මේ ශිෂ්‍යයන් පොත් නොකියවන්නේ යැයි කියනු ලැබෙයි. විශේෂයෙන් ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ පොත් කියවීම පිළිබඳ නිතර කතාකරනු ඇසිය හැකි ය. ඔවුන් අඩුම තරමින් කෙටි කතා පොතක්වත් නොකියවන්නේ ඔවුන් අදාළ සංස්කෘතියක නොවන බැවින්, එනම් ඒ සිසුන් එක්කෝ ඉංගිරිසි කතාකරන ව්‍යාජ විදග්ධ සංස්කෘතියට නැත්නම් එලෙස ම ව්‍යාජ වූ විදග්ධ සිංහල සංස්කෘතියට එක්කරගෙන නැති බැවින්, ය යන්න බොහෝ දෙනකු තේරුම්ගත් බවක් නො පෙනෙයි. මේ සිසුන් අද අයත්වන්නේ නන්නත්තාරවූවන්ගේ ගණයට ය.

එදා පාසල්වල ඉහළ පන්තිවල හා විශ්වවිද්‍යාලයේ ඉගෙනගත් සිසුන් ව්‍යාජ විදග්ධ සංස්කෘතීන් දෙකෙන් එකකට හෝ ඇතැම්විට දෙකට ම හෝ අයත්වන්නනටත් අද සිසුන්ගෙන් අතිවිශාල බහුතරය ඒ සංස්කෘති දෙකෙන් එකකටවත් අයත් නොවන්නටත් හේතුව කුමක් ද? එයට හේතුව සිංහලෙන් අධ්‍යාපනය ලැබීම යැයි මේ වන විට ඇතැමකු සිතනු ඇත. ඔවුන් ව්‍යාජ ඉංගිරිසි විදග්ධ සංස්කෘතියට අයත් නොවීමට ඒ එක් හේතුවක්, එහෙත් ප්‍රධාන නොව ආන්තික හේතුවක්, විය හැකි ය. සිංහලෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අධ්‍යාපනයක් ඒ සංස්කෘතියෙහි වැදගත් ලක්‍ෂණ ද සහිතව දිය හැකි යැයි නො සිතමි. ඒ ඉංගිරිසියෙන් බුද්ධ ධර්මය දේශනාකිරීම වැන්නකි. ඒ කෙසේ වෙතත් වත්මන් සිසුන් ව්‍යාජ සිංහල විදග්ධ සංස්කෘතියට ද අයත් නොවන්නේ ඇයි? සිංහලෙන් අධ්‍යාපනය ලබන මේ සිසුන් ව්‍යාජ වුවත් විදග්ධ සිංහල සංස්කෘතියට ද අයත් නොවන්නේ ඇයි ද යන්න සාකච්ඡා කළ යුතු ය. .

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva